# සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රචා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**

**S Jayasinghe**
03 8707 4604
0402 025 516
email- sjturaus@optusnet.com.au

**Kuma Gamage**
0414 215 280
email- ads.sannasa@gmail.com

**Account Details for Payments**

| | |
|---|---|
| **Account Name** | **- Sannasa Media** |
| Bank | - Westpac |
| BSB Number | - 033 341 |
| Account Number | - 590847 |

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318



පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත






**සමානාත්මතාව තුළින් මිත්‍රත්වයේ මාවත විවරවේ**
**ප්ලේටෝ**

## ලියා දන්වන වගයි

### අනේ මහින්ද. ආසාවට හරි එකම එක වැරදිකරුවකුට හෝ දඬුවමක් දෙන්න.

තමිල්නාඩුවේ මහ ඇමතිනිය වූ ජයලලිතා දූෂණ චෝදනා මත සිරගත කෙරුණි. ඒ ඉන්දියාවේය.

ශ්‍රී ලංකාවේ අධීක්ෂණ ඇමති සජින් වාස් එංගලන්තයේ මහ කොමසාරිස් දොස්තර ක්‍රිස් නෝනිස්ට කම්මුල් පාරක් දුන්නේ ප්‍රසිද්ධියේය. හිත් අමාරුවට පත් දොස්තර වැරදිකාරයාට දඬුවම් දෙන්නේ නැත්නම් සිය තනතුරෙන් ඉල්ලා අස්වන බව කීවේය. ජනාධිපතිතුමා ඔහුගේ ඉල්ලා අස්වීම බාර ගත්තේය.

පොලීසියේ විශේෂ ඒකකයකින් මීගමුවේ දේශපාලුවකුගේ නිවසින් කුඩු අල්ලා ගත්තේය. ජනාධිපතිවරයා තකහනියකින් හෙලිකොප්ටරයකින් ගොස් දේශපාලකයා බදා වැළඳගත්තේ පොලීසියේ කනට ගැසුවා සේය. පොලීසිය කුඩු පැත්තක දමා නිහඬ විය.

මර්වින් සිල්වා ඇමති රජයේ සේවකයෙක් ප්‍රසිද්ධියේ ගස් බැන්දේය. මර්වින්ට දුන් දඩුවමක් නැත .

මිනීමැරූ කැස්බෑවේ කත්‍රිආරච්චිලා සාක්කි නැතැයි කියා නිදහස් විය. විවෘත වරෙන්තුවක් ඇති සුදර්මන් රදලියගොඩ තවමත් රජයේ තනතුරක් දරමින් සිටියි.

කාන්තාවක් සිය දෙනකු දූෂණය කිරීමේ ප්‍රීතියට සාරුවා සුනිල් දේශපාලකයා දැමූ සාදයට රජයේ ඇමතිවරුත් සහභාගි වෙති. සාරුවා තවමත් යහතින්ය.

ත්‍රීමාවිතාණට ඇණ ගැසූ නාලන්ද එල්ලාවල මහ දවාලේ වෙඩි තබා මැරූ අය ඇමතිවරු බවට පත්වෙති. තමන්ගේම ආණ්ඩුවේ භාරත ලක්ෂ්මන්ට වෙඩිතබා මැරූ අය සමග ජනාධිපති එකට කා බී සතුටුවෙයි.

සංචාරක කතක් දූෂණය කර මරා දැමූ ප්‍රදේශීය දේශපාලකයා බේරා ගන්නට රජයේ මහතැන්වල අය වලි කති. අන්තර්ජාතික පීඩනය නො-වන්නට ඔහුද නඩු නැතිවම ගෙදර යන ඇත .

හිටපු ජනාධිපතිවරයකුගේ දියණියක බැංකුවකට ලක්ෂ ගණනක හොර සල්ලි දී අසු වෙයි. නඩුත් නැත.

එක්තරා ඇමැත්තෙක් ප්‍රදර්ශනය වන සෑම ටෙලිනාට්‍යයකින්ම රුපියල් විසිපන්දාහේ සිට පනස්දාහ දක්වා මුදලින් හෝ ටෙලි නාට්‍ය නිළියකගේ ශරීරය හෝ අල්ලස් ලෙස ප්‍රසිද්ධියේම ලබා ලබාගනියි. ජනාධිපතිවරයාට කළ පැමිනිලි බීරි අලියාට වීනා වාදනය කළා සේය. දුන් දඬුවමක් නැත.

දකුණු අධිවේගයේ අධිවේගයෙන් ආ නියෝජ්‍ය ඇමතිවරුයකුගේ රියදුරාට දඩ කොළයක් දුන් පොලිස් භටයා පැහැරගෙනගොස් පහර දී මරා දමන්නට තැත්කරයි. ඔහුගේ වාහනයද ගිණිබත් කර දමයි. යුක්තිය සාධාරණත්වය ඉටු නොවෙයි. පොලිස්භටයා පොලිස් සේවයෙන් ඉල්ලා අස්වෙයි.

රත්නපුරයේ ප්‍රාදේශීය දේශපාලුවෙක් පොලිස් ප්‍රසිද්ධියේ පොලිස් නිලධාරියකුට පහර දෙයි. නඩුත් නැත.

මේ ලැයිස්තුව බොහෝ දිගය. දිගට ලියන්නට ඉඩ මදිය. දිගින් දිගටම නොලියා එකම එකක් ඉල්ලන්නට අපි කැමැත්තෙමු.

අනේ මහින්ද. ආසාවට හරි එකම එක වැරදිකරුවකුට හෝ දඬුවමක් දෙන්න.

සංස්කාරක



# බුදු දහම පොසිටිව් තින්කින් නොවේද?
## නානසාරට බණ පදයක්...

අඤ්ඤදතරා පුත්ත විසිනි

සිවුරක් පොරවා ගෙන ගලගොඩ අත්තේ ඥානසාර නමින් පෙනී සිටින විකට ඇදුම්කාරයා පසුගියදා බොදු බල සේනාව නමින් හඳුන්වන තම ත්‍රස්තවාදී සංවිධානයේ මහ සමුළුවක් අමතා බුදු දහමේ එන අනිත්‍ය දහම පසෙක ලා පොසිටිව් තින්කින් හෙවත්, ධනාත්මක චින්තනය වෙත යොමු විය යුතු යැයි අවධාරණය කර තිබේ. එපමණක් නොව බෞද්ධ ධර්ම සාහිත්‍ය ග්‍රන්ථයක් වන ජාතක පොත ඉවත දමන ලෙසත් ඔහු තම අනුගාමිකයන්ගෙන් ඉල්ලා තිබේ.

මෙම ප්‍රකාශය රාජකීය පණ්ඩිත නම නම්බු නාමයෙන් තෙමේම හඳුන්වා ගනිතත් බුදු දහම හෝ බෞද්ධ දර්ශනය පිලිබඳව ඔහු තුල ඇති මුග්ධ භාවය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්නකි. විද්‍යාවත් අවිද්‍යාවත් අතර ඇති වෙනස මැනැවින් විදහා දක්වන, මෝහයත් අවිද්‍යාවත් අතර ඇති අවියෝජනීය සබඳතාව නොයෙක් වර නොයෙක් තැන උදාහරණ සහිතව පෙන්වා දී ඇති බුදු දහමට මුවා වී ඥානසාර මේ කරන්නේ නොමේරූ භික්ෂූන් අතර අවිද්‍යාව පැතිරවීම ය. මෝහය නඩත්තු කිරීමය.

බුදු දහම යනු හේතු ඵල වාදයකි. ඒ අර්ථයෙන්ම බුදු දහම දාර්ශනිකව ධනාත්මකය. බෞද්ධ හේතු ඵල වාදයෙහි සාකච්ඡාවට ගැනෙන සියළු ප්‍රපංචයන් ප්‍රඥා ගෝචර ප්‍රත්‍යක්ෂයන් මිස අත්භූතයන් හෝ අනුභූතීන් නොවන නිසාම එය සහමුලින්ම ධනාත්මක වේ. එය කොතරම් සංකීර්ණ ලෙස සහ සවිස්තර ලෙස විග්‍රහ කොට ඇතිදැයි විමසීම සඳහා ඥානසාර වහාම ධර්මධර නායක ස්වාමීන් වහන්සේ නමක සොයා ගොස් පටිච්ච සමුප්පාදය හරියාකාර ලෙස උගත යුතුය. එවිට හේතුව සහ ඵලය අතර ඇති අන්තර් සම්බන්ධතාවය පමණක් නොව හේතුවක් නිසා ඇතිවන ඵලයක් ඊළඟ ඵලයෙහි හේතුව පත්වන අරුමය පවා උගත හැකිය. නූතන බටහිර ඥාන සම්ප්‍රදායෙහි එන ධනාත්මක චින්තනයත්, බෞද්ධ දර්ශනයෙහි එන ධනාත්මක චිනතනයත් යනු දෙකකි. බටහිර ධනාත්මක චින්තන සංකල්පය ගොඩ නගනු ලැබ ඇත්තේ පාරිභෝගිකවාදී සමාජ ආර්ථික ක්‍රමයෙහි නඩත්තුව උදෙසාය. එහෙත් බෞද්ධ ධනාත්මක චින්තනය එය ඉක්මවා යන පුළුල් වපසරියක් ස්පර්ශ කරයි.

බෞද්ධ දර්ශනයෙහි එන මූලික ඉගැන්වීමක් වන චතුරාර්ය සත්‍යය යනු අපගේ ජීවිත වල නොයෙක් දුෂ්කර දුරවබෝධ තැන්වලදී ආදේශ කොට මහගු ප්‍රතිඵල නෙලා ගත හැකි සර්වකාලීන සූත්‍ර සංක්ෂිප්තයකි. ගණිතමය භාෂාවෙන් කියන්නේ නම් ෆෝමියුලාවකි.

> බුදුන් වදාල සම්මා දිට්ඨිය ඥානසාර ඉල්ලා සිටින මිත්‍යා දිට්ඨියට විරුද්ධය. ඔහු කැම්පේන් කරන මිත්‍යා සංකල්පයන්ට විරුද්ධය. ඔහු තම කතාවෙන් සහ ක්‍රියාවෙන් තමන් පසුපස එන බෞද්ධයන්ගේ සතිය සමාධිය බිඳ හෙළයි.

ඥානසාර හොඳයි*සැපයි කියන ධනාත්මක චින්තනයේ පැන නගින නූතන


6 වන පිටට